ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2456/44 - 2025 ඔක්තෝබර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2025.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: POL/ELH/LND/01/විවිධ/52.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/2/2014/WR/278.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මෙහි මහජන කටයුත්තක් යනු කිරිඔය අලිමංකඩ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම වේ.

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 01, කිරිඔය ග්‍රාම නිලධාරි වසමේ කිරිඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 120230, කලාප අංක – 01, පත්‍ර අංක 2, 2025.08.05 දිනැතිව සකස් කරන ලද පිඹුරේ කැබලි අංක 1, 2, 3 , 4 වශයෙන් සඳහන් කෙරෙන ඉඩම් කැබලි හා අ.හු.පි. 25, අතුරු පිඹුරු අංක 192, පත්‍ර අංක 203 හි 2025.07.31 දිනැති පිඹුරේ කැබලි අංක 8702 ඉඩම් කැබැල්ල.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම: අතරගල්ලෑව කැලේ, වර්තමාන ඉඩම් පරිහරණය; කුඹුර; හිමිකම් කියන්නා: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව - අතරගල්ලෑව, පොල්අතුවාඩිය හි පදිංචි මුතුතන්ත්‍රිගේ රනිල් ප්‍රසන්න විසින් අනවසරයෙන් වගාකර ඇත. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිඔය අලිමංකඩ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වී ඇත. ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.6759.

උතුර: අ.හු.පි. 25 හි කැබලි අංක 8701 සහ 8709 නැගෙනහිර : අ.හු.පි. 25 හි කැබලි අංක 8709, 8793 සහ 8794, දකුණ : අ.හු.පි. 25 හි කැබලි අංක 8794, 8796 මෙම පිඹුරේ කැබලි අංක 2, 3, 4 සහ අ.හු.පි. 25 හි කැබලි අංක 8702, බටහිර: අ.හු.පි. 25 හි කැබලි අංක 8702, 8709 සහ 8701.

**02. කැබලි අංක 2**

ඉඩමේ නම: කලවුගහවෙල කුඹුර, වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර, හිමිකම් කියන්නා; මුතුතන්ත්‍රිගේ රනිල් ප්‍රසන්න, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව— මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිඔය

1A - G 045478 – 08 (2025/10)

*මෙම ගැසට් පත්‍රය අති විශෙෂ www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අලිමංකඩ ස්ථාපනය කිරීමට අත්කර ගැනීම සඳහා; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.2722.

උතුර: කැබලි අංක 1, නැගෙනහිර : කැබලි අංක 1 සහ අ.හු.පි. 25 හි කැබලි අංක 8796, දකුණ : අ.හු.පි. 25 හි කැබලි අංක 8796 සහ මෙම පිඹුරේ කැබලි අංක 3, බටහිර : කැබලි අංක 3, 4 සහ 1.

**03. කැබලි අංක 3**

ඉඩමේ නම: කලවුගහවෙල කුඹුර, වර්තමාන ඉඩම් පරිහරණය; කුඹුර; හිමිකම් කියන්නා: මන්ත්‍රිලාගේ පොඩිහාමිනේ, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව: මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිඔය අලිමංකඩ ස්ථාපනය කිරීමට අත්කර ගැනීම සඳහා; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.1816.

උතුර: කැබලි අංක 4, 1 සහ 2, නැගෙනහිර : කැබලි අංක 2 සහ අ.හු.පි. 25 හි කැබලි අංක 8796, දකුණ : අ.හු.පි. 25 හි කැබලි අංක 8796, පත්‍ර අංක 1 හි කැබලි අංක 2 සහ 1, බටහිර: පත්‍ර 1 හි කැබලි අංක 1 සහ මෙම පිඹුරේ කැබලි අංක 4.

**04. කැබලි අංක 4**

ඉඩමේ නම: අතරගල්ලැව කැලේ, වර්තමාන ඉඩම් පරිහරණය; කුඹුර; හිමිකම් කියන්නා: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව: ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අතරගල්ලැව, පොල්අතු වාඩියෙහි පදිංචි මන්ත්‍රිලාගේ පොඩිහාමිනේ විසින් අංක පො/ඈ/70ජී/219 දරන බලපත්‍රය මත වගාකර ඇත. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිඔය අලිමංකඩ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වී ඇත; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.2145.

උතුර: අ.හු.පි. 25 හි කැබලි අංක 8702 සහ මෙම පිඹුරේ කැබලි අංක1, නැගෙනහිර : කැබලි අංක 1, 2 සහ 3, දකුණ : කැබලි අංක 3, පත්‍ර 1 හි කැබලි අංක 1 සහ අ.හු.පි. 25 හි කැබලි අංක 8709, බටහිර: අ.හු.පි. 25 හි කැබලි අංක 8709 සහ 8702.

**05. කැබලි අංක 8702**

ඉඩමේ නම: අතරගල්ලැව කැලේ, වර්තමාන ඉඩම් පරිහරණය; ලඳු කැලෑව; හිමිකම් කියන්නා: රජය, ව්‍යවස්ථාපිත විධිවිධාන සහ මැනීමට හේතුව: ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අතරගල්ලැව, පොල්අතු වාඩියෙහි පදිංචි මන්ත්‍රිලාගේ පොඩිහාමිනේ විසින් අංක පො/ඈ/70ජී/219 දරන බලපත්‍රය මත වගාකර ඇත. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිඔය අලිමංකඩ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වී ඇත; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.1300.

උතුර: කැබලි අංක 8701 සහ 8703, නැගෙනහිර : කැබලි අංක 8703 සහ 8704, දකුණ: කැබලි අංක 8704 සහ 8709, බටහිර: කැබලි අංක 8709 සහ 8701.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.10.27 වැනි දින පෙ.ව. 9.30 ට ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2025.10.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**සී. එම්. කරුණාරත්න,**
ප්‍රාදේශීය ලේකම් .
ඇලහැර

2025 ක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින,
ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0013